5.06.2016

පැළවාර්ගය - 2016

Learning Resource Center
De Mazenod College
Kandana

# ද මැසිනොද් විද්‍යාලය
## දේශපාලන විද්‍යාව
### 13 වසර
### කලා

කාලය පැය 2

අංක 1 - 15 දක්වා ප්‍රශ්න වලට සපයා ඇති ප්‍රකාශ 5 අතුරින් හතරක් පමණක් නිවැරදි වේ. නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1. දේශපාලන විද්‍යාව,
   A – සමාජ විද්‍යාවක් ලෙස සැලකේ.
   B – මිනිසුන්ගේ දේශපාන චර්යාව සහ දේශපාලන ක්‍රියාවන් අධ්‍යයනය කිරීම පිළිබඳව සැලකිලිමත් වේ.
   C – ස්වභාවික විද්‍යා සමග සමීපව සම්බන්ධ වේ.
   D – මූලික විද්‍යාව වශයෙන් සැලකේ.
   E – විධිමත් ලෙස අධ්‍යයනය කිරීම ඇරඹුනේ පැරණි ග්‍රීසිය තුළය.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

2. දේශපාලන විද්‍යාව උපකල්පනය කරන ආකාරයට,
   A – මිනිසා ස්වභාවයෙන්ම දේශපාලන ජීවියෙකු වන්නේ ය.
   B – සෑම මිනිසෙකුටම උපතින්ම යම් ප්‍රමාණයක දේශපාලන ඥානයක් රැගෙන එන්නේය.
   C – මිනිසුන් දේශපාලනය කථා කිරීම සහ එහි නියැලීම ස්වභාවික දෙයක් වන්නේ ය.
   D – මිනිසාට දේශපාලනය කොතරම් ස්වභාවික ද යත් මිනිසුන් දේශපාලනයෙන් වෙන් කළ නොහැකි වන්නේ ය.
   E – දේශපාලනය සහ දේශපාන විද්‍යාව අනන්‍ය සම වන්නේ ය.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

3. රාජ්‍යයේ ආරම්භය,
   A – දේවවරම් වාදයට අනුව දෙවියන් වහන්සේගේ නිර්මාණයක් වේ.
   B – සමාජ සම්මුතිවාදයට අනුව සමාජ සම්මුතියක ප්‍රතිඵලයක් වේ.
   C - ලිබරල්වාදයට අනුව පොදු යහපත උදෙසා මිනිසුන් කළ නිර්මාණයක් වේ.
   D – මාක්ස්වාදයට අනුව පෞද්ගලික දේපළ ක්‍රමය පැන නැගීමේ ප්‍රතිඵලයක් වේ.
   E – පැසිස්ට්වාදයට අනුව දිගු සමාජ විකාශනයක ප්‍රතිඵලයක් වේ.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

4. නූතන න්‍යායන්ට අනුව නූතන රාජ්‍ය වල හැඩ ගැසීම කෙරෙහි බලපා ඇති සාධක වන්නේ,
   A - කුස්තවාදය
   B – ඒකාබද්ධ කිරීම
   C – වෙන්වීම
   D – ජාතිකවාදය
   E – පරිවර්තනය

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

5. ආණ්ඩුව පිළිබඳව ඉදිරිපත් වී ඇති නිර්වචන කීපයක් වන්නේ,
   A – මිනිස් සමාජය පාලනය කරන පරිපාලනය කරන සංවිධානය.
   B – මිනිස් සමාජය පාලනය කරන සංවිධානය
   C- මිනිස් සමාජය කළමනාකරණය කරන සංවිධානය
   D – රාජ්‍ය පාලනය කිරීම සඳහා සහභාගි වන පුද්ගල කණ්ඩායම අන්තර්ගත සංවිධානය.
   E – රාජ්‍යයේ දේශ සීමාව තුළ ජීවත් වන සියලුම දෙනා නියෝජනය කරන සංවිධානය.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

6. ආණ්ඩුව සමාජ සංවිධානයක් වුවද එය අනෙක් සමාජ සංවිධාන වලින් වෙනස් වන්නේ,
A – බලාධිකාරී බලය පදනම් කරගෙන ඒකීය නීති පැනවීමට ඇති හැකියාව නිසාය.
B – සුජාතභාවය මත ජනතාවගේ ජීවිතය හා මරණය ගැන තීන්දු ගත හැකි නිසාය.
C – සාමාජිකයින් වුව ද නොවූවද සියලුම පුරවැසියන් කෙරෙහි රාජ්‍ය බලය යෙදවිය හැකි නිසාය.
D – අනෙක් සමාජ සංවිධාන වල පැවැත්ම පිළිබඳව තීරණය කළ හැකි නිසාය.
E – රාජ්‍යයේ පැවැත්ම සම්බන්ධයෙන් අවසාන තීන්දු ගත හැකි නිසාය.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

7. ආණ්ඩුව බලය ක්‍රියාවට නංවන මාර්ගය වන්නේ,
A – ආණ්ඩුවේ බලය නීත්‍යානුකූල වේ යන අදහස විශ්වාස කිරීමට ජනතාව පොළඹවාලීම මගින්.
B – වරදාන දීම හා තර්ජන කිරීම මගින්
C – බලය යෙදවීම මගින්
D – ආගමික සහ සදාචාර විශ්වාස මගින්
E – දඬුවම් කිරීම මගින්

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

8. ආණ්ඩුවේ බලය පාලනය කළ හැකි මාර්ග වන්නේ,
A – පොලිසිය හා සිවිල් සේවය
B – ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව
C – බලතල බෙදීම
D – සංචරණය හා තුලනය
E – අධිකරණ විවරණ බලය

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

9. මහජනතාව ආණ්ඩුව සමග යා කරන මාර්ග වන්නේ,
A – මැතිවරණ
B – ජනමත විචාරණය
C – දේශපාලන පක්ෂ
D – රාජ්‍ය නොවන සංවිධාන
E – බලපෑම් කණ්ඩායම් සහ මහජන මතය

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

10. දේශපාලන හා ආර්ථික මතවාද අනුව ආණ්ඩුක්‍රම වර්ග කරන ක්‍රම වන්නේ,
A - ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී
B – කවිපයාධිකාරී
C – නව ලිබරල්වාදී
D – සමාජවාදී
E – සමාජ ප්‍රජාතන්ත්‍රවාදී

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

11. සන්ධීය ආණ්ඩුක්‍රමයක පදනම් මූලධර්ම වනුයේ,
A – දුර්වල මධ්‍යම ආණ්ඩුව හා ශක්තිමත් සන්ධීය ඒකක ආණ්ඩු
B – බල හවුල්කාරීත්වය
C - ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා එහි අනම්‍යභාවය
D – ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආරක්ෂකයා ලෙස ක්‍රියාකරන ස්වාධීන අධිකරණයක් තිබීම.
E – සන්ධීය ඒකක වලට සමානව සැලකීම.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

12. ධනවාදී ආණ්ඩුවක මූලික ලක්ෂණ වනුයේ,
A – පෞද්ගලික දේපළ හිමිකම පිළිගැනීම.
B – නිදහස් ව්‍යාවසාය පිළිගැනීම
C – විවෘත වෙළඳපොළ ක්‍රමය පිළිගැනීම
D – ආර්ථිකය පාලනය කිරීම සඳහා රාජ්‍යයේ අවම මැදිහත්වීම.
E – රාජ්‍යය කිසිවක් නොකළ යුතුය සහ පෞද්ගලික අංශය සියල්ල කළ යුතුය යන න්‍යාය පිළිගැනීම.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

13. සමාජවාදී ආණ්ඩුවක ප්‍රධාන ලක්ෂණ වනුයේ,
A - තනි පක්ෂයක නායකත්වය සහිත දේශපාලන ක්‍රමය
B – පෞද්ගලික දේපළ අයිතිය නොපැවතීම
C – නිෂ්පාදනය, බෙදාහැරීම හා හුවමාරුව පිළිබඳ රාජ්‍ය ඒකාධිකාරය
D – දේශපාලන නිදහස කැප කිරීම මත ගොඩනැගුණු ආර්ථික සමානාත්මතාව
E – ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම මත ආණ්ඩුක්‍රම ව්‍යුහයන් ගොඩනගා තිබීම

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

14. ඒකාධිපති ආණ්ඩුවක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වනුයේ,
A - තමන් විසින්ම පත්කරගත් පාලකයා
B – නීතියට යටත් නොවූ අසහාය පාලනය
C – පාලකයා වගකීමට යටත් නොවීම
D – නිශ්චිත ආර්ථික හා දේශපාලන දර්ශනයක් මත පාලනය පවත්වාගෙන යාම
E – පාලිතයන් මත රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීම සඳහා හිංසාකාරී ක්‍රියාමාර්ග භාවිතයට ගැනීම

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

15. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණ වනුයේ,
A – ව්‍යවස්ථානුකූල ආණ්ඩුව සහ නීතියේ ආධිපත්‍ය
B – මහජන ස්වාධිපත්‍ය හා පාලකයින් ජනතාවට වගකීම
C – අධිකරණයේ ස්වාධිපත්‍ය
D - තරඟකාරී දේශපාලන පක්ෂ ක්‍රමය හා මාධ්‍ය නිදහස
E – සියලුම මිනිසුන් එක හා සමානය නමුත් සමහර මිනිසුන් අනෙක් මිනිසුන්ට වඩා සමානය යන සිද්ධාන්තය පිළිගැනීම.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

අංක 16 - 22 දක්වා ඇති ප්‍රශ්න සඳහා සපයා ඇති ප්‍රකාශ පහ අතුරින් මාතෘකාවට අදාළ නොවන ප්‍රකාශය තෝරන්න.

16. මානව අයිතිවාසිකම්,
1. මිනිසෙක්වීම නිසාම මිනිසාට හිමිවන්නාවූ අයිතිවාසිකම් වේ.
2. සෑම මිනිසෙකුටම හිමිවන බැවින් විශ්වීය ස්වරූපයක් ගනී.
3. අහිමිකිරීමට පවරාදීමට හා ආපසු ගැනීමට නොහැකි බැවින් මූලික අයිතිවාසිකම් බවට පත්වේ.
4. මානවයන්ගේ ආත්ම ගරුත්වයට සහ පැවැත්මට අවශ්‍ය වේ.
5. නීතියෙන් හිමිකම් කිවහැකි අයිතිවාසිකම් පමණක් වේ.

17. දේපල
    1. ස්වයං හිමිකම් පදනම් කරගත් අයිතියක් වේ.
    2. ආර්ථික අභිවෘද්ධිය හා කාර්යක්ෂමතාව ඇති කිරීම පිණිස ශ්‍රමය දිරිගන්වන උත්තේජනයක් ලෙස සැලකේ.
    3. පුද්ගල නිදහස ස්වාධීනත්වය හා ස්ව පැවැත්ම ශක්තිමත් කරන වැදගත් සාධකයක් ලෙස සැලකේ.
    4. සමාජ අගය කිරීම් වර්ධනය කිරීම සඳහා දායක වන්නා වූ වැදගත් මූලාශ්‍රයක් වේ.
    5. පුද්ගලයාගේ සමාජ පැවැත්ම සඳහා අත්‍යාවශ්‍යම සාධකයක් ලෙස සමාජවාදීන් විසින් ද පිළිගෙන තිබේ.

18. දේශපාලන නියෝජනය,
    1. පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් විසින් පුළුල් ජන සමූහයක් වෙනුවෙන් පෙනී සිටින හෝ ක්‍රියා කරන ආකාරය පෙන්නුම් කරන සම්බන්ධතා විධික්‍රම වේ.
    2. නියෝජන ආණ්ඩුක්‍රමය ක්‍රියාවට නංවන පදනම් මූලධර්මය වේ.
    3. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය තුළ ආණ්ඩුව හා ජනතාව යා කරන මාධ්‍යය වේ.
    4. තනි ඡන්දය - අසමාන අගය කිරීම් යන පදනම යටතේ ක්‍රියාත්මක වේ.
    5. නූතන තත්ත්වයන් යටතේ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකි එකම ක්‍රමය ලෙස සැලකේ.

19. පුරවැසියා,
    1. රාජ්‍යයේ පිළිගැනීම සහිත දේශපාලන සමාජයක සාමාජිකයෙකු ලෙස අර්ථකථනය කර ඇත.
    2. රාජ්‍යය මගින් ප්‍රදානය කරන විශේෂිත අයිතිවාසිකම් හා බැඳීම් සමූහයක් සහිත අයෙකු වේ.
    3. විදේශිකයන් යන යෙදුම සමග සමපාත වේ.
    4. උපතින් හෝ ලියාපදිංචි වීමෙන් හිමිවේ.
    5. ඡන්ද බලය දීමට සහ සමහර රාජ්‍ය තනතුරු පිරිනැමීමට යොදා ගැනෙන එකම නිර්ණායකය වේ.

20. සිවිල් සමාජය,
    1. රාජ්‍යයේ පාලනයෙන් මුළුමනින්ම ව්‍යුක්ත වූ සමාජය වේ.
    2. රාජ්‍යය හා පවුල යන සංවිධාන වලට පරිබාහිර වශයෙන් ගොඩනඟා ඇති මධ්‍යස්ථ සංවිධාන වලින් සමන්විත සමාජය වේ.
    3. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය හොඳින් ක්‍රියාත්මක වී සඳහා අවශ්‍යම සාධකයක් ලෙස සැලකේ.
    4. ආණ්ඩුවේ බලය පාලනය කිරීම සඳහා යෙදවිය හැකි වැදගත් සංරෝධකයක් ලෙස සැලකේ.
    5. ජනතාව දේශපාලන හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම සඳහා යොදාගත හැකි උපකරණයක් ලෙස සැලකේ.

21. ඇමරිකා එක්සත් ජනපදයේ දේශපාලන ක්‍රමය,
    1. 1789 දී ස්ථාපිත කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මත පදනම් වී ඇත.
    2. ප්‍රාන්ත රාජ්‍ය පනහකින් සමන්විත සන්ධීය රාජ්‍යයක් වේ.
    3. ජනතාව විසින් සෘජුව පත්කරන ජනාධිපතිවරයෙකු නායකත්වය දරනු ලැබේ.
    4. සම්භාව්‍ය සන්ධීය මූලධර්ම මත ගොඩනැගුණු සන්ධීය ක්‍රමයක් වේ.
    5. මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත රාජ්‍යයන් අතර බල හවුල්කාරිත්වය පදනම් කරගෙන ගොඩනැගුණු එකක් වේ.

22. මහා බ්‍රිතාන්‍යයේ පාර්ලිමේන්තුව
    1. නීති සම්පාදනය සම්බන්ධයෙන් ස්වාධිපති බලය දරන අතර එම හේතුවෙන් ඕනෑම නීතියක් සෑදීමට හෝ අවලංගු කිරීමට බලය ඇත.
    2. ද්වි මාණ්ඩලික වන අතර එයින් බලවත්ම ආයතනය මහජන මන්ත්‍රී මණ්ඩලය වේ.
    3. විශ්වාසභංග යෝජනාවක් මගින් දේශපාලන විධායකය ඉවත් කිරීමේ හැකියාව භුක්ති විඳිනු ලැබේ.
    4. දේශපාලන විධායකය තෝරා පත් කරන මූලාශ්‍රය වේ.
    5. නාමික විධායකය විසින් ස්වකීය අභිමතානුකාරී බලය යොදවා විසුරුවා හැරීමට යටත් වේ.

දේශපාලන විද්‍යාව
13 ශ්‍රේණිය · ?

23 - 30 දක්වා ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාව හා සම්බන්ධව ප්‍රකාශ 5 ක් දක්වා ඇත. ඒවායින් 4 ක් සාවද්‍යය. සාවද්‍ය ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

23. අන්තර්ජාතික දේශපාලනය යන්නෙන් අදහස් කරන්නේ,
A) නිදහස් ස්වාධිපති ජාතික රාජ්‍යයන් අතර කෙරෙන්නාවූ දේශපාලනය.
B) අන්තර්ජාතික සමාජය තුළ පුද්ගල කණ්ඩායම් අතර කෙරෙන්නා වූ දේශපාලනය.
C) අන්තර්ජාතික රාජ්‍ය සංවිධාන අතර කෙරෙන්නා වූ දේශපාලනය.
D) අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන අතර කෙරෙන්නා වූ දේශපාලනය.
E) බහුජාතික සමාගම අතර කෙරෙන්නා වූ දේශපාලනය.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

24. රාජ්‍ය ප්‍රතිපත්තිය යනුවෙන් අදහස් කරන්නේ,
A) පුද්ගලයෙකු විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරි සැලැස්මක් ය.
B) පුද්ගල කණ්ඩායමක් විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරි සැලැස්මක් ය.
C) ව්‍යාපාරික සමාගමක් විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරි සැලැස්මක්ය.
D) කුටුම්බයක් විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරි සැලැස්මක්ය.
E) ආණ්ඩුව විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරි සැලැස්මක් ය.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

25. සමාජ ගැටුමක් යනු,
A) පුද්ගලයා තුළ ඇතිවන ගැටුමක්ය.
B) පුද්ගලයන් දෙදෙනෙකු අතර ඇතිවන ගැටුමක්ය.
C) සංවිධාන දෙකක් අතර ඇතිවන ගැටුමක්ය.
D) සමාජ කණ්ඩායම් දෙකක් අතර ඇතිවන ගැටුමක්ය.
E) රටවල් දෙකක් අතර ඇතිවන ගැටුමක්ය.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

26. රාජකාරි ක්‍රමය අහෝසි කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය වූයේ,
A) කෝල්බෘක් - කැමරන්
B) මැනිං
C) මැනිං - ඩෙවන්ෂයර්
D) ඩොනමෝර්
E) සෝල්බරි

ii) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

27. ලංකාවේ ව්‍යවස්ථාදායක සභාවට නියෝජිතයන් තෝරාපත් කර ගැනීමට ප්‍රථම වරට ඡන්ද බලය හඳුන්වා දුන් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය වූයේ,
A) 1833 කෝල්බෘක් - කැමරන් ප්‍රතිසංස්කරණ
B) 19110 කෲව් - මැකලම් ප්‍රතිසංස්කරණ
C) 1924 මැනිං - ඩෙවන්ෂයර් ප්‍රතිසංස්කරණ
D) 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ
E) 1948 සෝල්බරි ප්‍රතිසංස්කරණ

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

28. 1924 මැනිං - ඩෙවන්ෂයර් ආණ්ඩුක්‍රමය අසාර්ථකවීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධකය වූයේ,

A) වාර්ගික නියෝජනය
B) ව්‍යවස්ථාදායකයේ මුළු සාමාජික සංඛ්‍යාව ඉහළ දැමීම
C) නිල නොලත් සාමාජිකයින් ඡන්දයෙන් තෝරා ගැනීමේ ක්‍රමය හඳුන්වාදීම
D) වගකීමෙන් බලය වෙන් කිරීම
E) මුදල් කාරක සභාවේ තත්ත්වය ශක්තිමත් කිරීම

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

29. ලංකාවේ ජාතික ව්‍යාපාරය

A) බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයෙන් පූර්ණ නිදහස ලබා ගැනීම සඳහා ඉතාම දැඩි ලෙස උද්ඝෝෂණ ව්‍යාපාරයන් හි නියුක්ත විය.
B) ජාතික අනුකලනය ගොඩනැගීම සඳහා දැඩි ලෙස උනන්දු විය.
C) බටහිරකරණය වූ සමාජීය ප්‍රභූන් ආරම්භ කොට නායකත්වය දුන් සාමකාමී ව්‍යාපාරයක් විය.
D) සමාජයේ සෑම සාමාජීය හා වාර්ගික කණ්ඩායම් සහභාගි වූ ජනතා ව්‍යාපාරය විය.
E) ඉන්දියානු ජාතික ව්‍යාපාරයට බෙහෙවින්ම සමාන විය.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

30. ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරය

A) වතු ව්‍යාපාරයෙන් උපත ලද නව ලාංකික ධනපති පංතිය විසින් ආරම්භ කළේය.
B) යුතෝපීය සමාජවාදීන්ගේ අදහස්වලින් දැඩිව බලපෑම් ලද ව්‍යාපාරයක් විය.
C) ලංකාව තුළ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් පිහිටුවීම ඉලක්ක විය.
D) බටහිර අධ්‍යාපනය ලද මාක්ස්වාදයට නැඹුරු වූ තරුණ රැඩිකල් කණ්ඩායමක් විසින් ආරම්භ කළේය.
E) නිදහස දිනා ගැනීම උදෙසා ලංකා ජාතික සංගමය සමග සමීප සහයෝගිතාවයකින් ක්‍රියා කළේය.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

**31 - 41 දක්වා ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාව හා සම්බන්ධව ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත. ඒවායින් නිවැරදි වන්නේ ප්‍රකාශ හතරක් පමණි. නිවැරදි ප්‍රකාශ අන්තර්ගත කාණ්ඩය තෝරන්න.**

31. වගකීම් සහිත ආණ්ඩුක්‍රමයක් ලංකාවට ලබාදීම නිර්දේශ නොකිරීම සඳහා ඩොනමෝර් කොමිසම කෙරෙහි බලපෑ හේතු සාධක වූයේ,

A) දේශිය දේශපාලඥයින් දේශපාලන වශයෙන් මුහුකුරා නොතිබීම.
B) ජනතාව තුළ සාමූහික හැඟීමක් සහ එක්සත්භාවයක් නොතිබීම.
C) සාමාන්‍ය ජනතාවගේ දේශපාලන සහභාගීත්වය පහළ මට්ටමක පැවතීම.
D) වගකීම් සහිත ආණ්ඩුක්‍රමයකට එරෙහිව බර්ගර් ජන කොටස දැක්වූ දැඩි විරුද්ධත්වය
E) සංවිධානාත්මක දේශපාලන පක්ෂ ක්‍රමයක් නොතිබීම.

ii) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

32. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ආණ්ඩුකාරයා

A) බ්‍රිතාන්‍ය කිරීටයේ සහ බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ නියෝජිතයා විය.
B) අමාත්‍ය මණ්ඩලයේ නායකයා විය.
C) ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන විධායකයා විය.
D) යටත් විජිතය තුළ අධිරාජ්‍යයේ ආශාවන් ආරක්ෂා කිරීමේ ප්‍රධානියා විය.
E) සෑම පනතකටම අවසාන අනුමැතිය දීමේ බල අධිකාරිය ඉසිලීය.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

දේශපාලන විද්‍යාව
13 ශ්‍රේණිය I

33. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ,

A) අග්‍රාණ්ඩුකාරයා සහ කැබිනට් අමාත්‍යවරුන්ගෙන් සමන්විත විධායක ආණ්ඩුව.
B) අග්‍රාණ්ඩුකාරවරයෙකු සෙනෙට් මණ්ඩලය සහ මහජන මන්ත්‍රී මණ්ඩලය යන නම් වලින් හැඳින්වුනු ද්විත්ව මණ්ඩලයෙන් ද සමන්විත ව්‍යවස්ථාදායකය.
C) අග්‍රාණ්ඩුකාරවරයා ව්‍යවස්ථාදායකයට වගකිව යුතු වීම.
D) ස්වාධීන රාජ්‍ය සේවාවක් පවත්වාගෙන යාම සහතික කිරීම උදෙසා ස්ථාපිත කළ රාජ්‍ය සේවා කොමිසම
E) ශ්‍රේෂ්ඨාධිකරණයේ නායකත්වයෙන් යුත් ස්වාධීන අධිකරණය.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

34. 1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ දේශපාලන විධායකය

A) කැබිනට් අමාත්‍ය මණ්ඩලය ලෙස හැඳින්විනි.
B) අග්‍රාණ්ඩුකාරයා විසින් මහජන මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයින් අතුරින් පත් කෙරිණ.
C) අගමැති නමින් හැඳින්වුන ඇමතිවරයෙකුගෙන් නායකත්වය යටතේ පැවතියේ ය.
D) පාර්ලිමේන්තුවට සාමුහිකව වගකිව යුතු විය.
E) ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරන ලද විශ්වාසභංග යෝජනාවක් මගින් ඉවත් කළ හැකි විය.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

35. සුළුජන කොටස් වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා සෝල්බරි ව්‍යවස්ථාවෙන් සැපයූ විශේෂ ආවරණ

A) මූලික අයිතිවාසිකම් පිළිබඳ විශේෂ පරිච්ඡේදය
B) ව්‍යවස්ථාවේ 29(2) වගන්තිය
C) සෙනෙට් සභාව
D) බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ සහ අග්‍රාණ්ඩුකාරවරයා විසින් නාමකරණයෙන් සය දෙනෙකු නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට පත් කිරීම.
E) ස්වාධීන අධිකරණ සහ ස්වාධීන රාජ්‍ය සේවාව

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

36. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන අංග ලක්ෂණ

A) වෙස්ට්මිනිස්ටර් ආකෘතියෙන් පූර්ණ ලෙස බිඳීයාම සනිටුහන් කළේය.
B) ශ්‍රී ලංකාව දේශපාලන වශයෙන් ස්වාධීන ස්වෛරී ජනරජයක් බවට පත් කළේය.
C) පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය හරහා ශ්‍රී ලංකාව සමාජ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් බවට පරිවර්තනය කිරීම ඉලක්ක කර ගත්තේය.
D) අධිකරණය සහ රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය අවප්‍රමාණ කළේය.
E) ශ්‍රී ලංකා රාජ්‍යයේ අනාගාමික ස්වරූපය වෙනස් කළේය.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

37. 1972 ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ ව්‍යවස්ථාදායකය,

A) ඒක මණ්ඩල වූ අතර ජාතික රාජ්‍ය සභාව නමින් හැඳින්විනි.
B) ජනතාවගේ ව්‍යවස්ථාදායක විධායක අධිකරණ බලය ක්‍රියාවට නැංවිය.
C) ජනතා පරමාධිපත්‍ය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් නීතිමය සීමාවන් නොවීය.
D) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට හැකි උත්තරීතර ව්‍යවස්ථාදායක බලය භුක්ති වින්දේය.
E) ජනතාව විසින් තෝරා පත් කළ නියෝජිතයන් 225 ක් සමන්විත විය.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

38. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,

A) ශ්‍රී ලංකාවේ "ගෝලිස්ට් ව්‍යාවස්ථාව" ලෙස හඳුන්වනු ලබයි.
B) විධායකයේ ස්වාධීනත්වය ඉතාම දැඩි ලෙස අවධාරණය කර ඇත.
C) විචේචකයින්ට අනුව ව්‍යවස්ථානුකූල ඒකතන්ත්‍ර පාලන ක්‍රමයක් ගොඩනැගීමට දායක වී ඇත.
D) අගමැති තනතුර ඉතාම දැඩි ලෙස අවප්‍රමාණ කර ඇත.
E) රටතුළ යහපාලනය ශක්තිමත් කිරීමට විශාල වශයෙන් දායක වී ඇත.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

39. 1978 ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා,

A) සය අවුරුදු නිල කාලයක් සඳහා ජනතාව විසින් සෘජුවම තෝරා පත් කෙරේ.
B) ජනතාවගේ විධායක බලය ක්‍රියාවට නැංවීමේ උත්තරීතර උපකරණය වේ.
C) විධායක බලතල ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වගකීමට බැඳී නැත.
D) 18 වන සංශෝධනයට අනුව ඕනෑම වාර ගණනක් නිලයට තේරී පත් විය හැක.
E) පාර්ලිමේන්තුව විසින් සම්මත කරන දෝෂාභියෝගයකින් නිලයෙන් ඉවත් කිරීමට යටත් වේ.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

40. 1978 ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය

A) ඒක මාණ්ඩලික වන අතර පාර්ලිමේන්තුව නමින් හැඳින්වේ.
B) ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාවට නංවන උත්තරීතර උපකරණය වේ.
C) රාජ්‍ය අරමුදල් වල උත්තරීතර භාරකරුවා වේ.
D) යම් යම් ව්‍යවස්ථානුකූල සීමාවන්ට යටත්ව ජනාධිපතිවරයා විසින් විසුරුවා හැරීමට යටත් වේ.
E) ජනතා ඡන්දයෙන් තේරී පත්වන නියෝජිතයන් 196 කින් සහ ජාතික ලැයිස්තුවෙන් පත් කෙරෙන මන්ත්‍රීවරුන් 29 න් සමන්විත වේ.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

41. 1978 ව්‍යවස්ථාවේ 105 වන වගන්තියට අනුව ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය සමන්විත වන්නේ,

A) ශ්‍රේෂ්ඨාධිකරණය
B) අභියාචනාධිකරණය
C) මහාධිකරණය
D) කාති විනිශ්චය සභා
E) පාර්ලිමේන්තුව විසින් කලින් කල නියම කොට පිහිටුවන වෙනත් මුල් අවස්ථා අධිකරණ

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

**42 - 46 දක්වා ඇති ප්‍රශ්න වල ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාලව ප්‍රකාශ පහක් දක්වා ඇත. එම ප්‍රකාශ අතුරින් එකක් නිවැරදි වේ. නිවැරදි ප්‍රකාශය තෝරන්න.**

42. 1978 ව්‍යවස්ථාවට අනුව අගමැති තනතුරට පත් කළ යුත්තේ,

(i) පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ වඩාත්ම ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයාය.
(ii) පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාවක් හිමිකරගෙන තිබෙන පක්ෂයේ නායකයාය.
(iii) පාර්ලිමේන්තුවේ බහුතර විශ්වාසය දිනාගත හැකි යයි ජනාධිපතිවරයා කල්පනා කරන මන්ත්‍රීවරයාය.
(iv) පාර්ලිමේන්තුවේ බහුතර බලය හිමි පක්ෂය විසින් නම් කරන මන්ත්‍රීවරයාය.
(v) පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම පක්ෂ ඒකමතිකව නිර්දේශ කරන මන්ත්‍රීවරයාය.

දේශපාලන විද්‍යාව 2016.06.05
13 ශ්‍රේණිය ?

43. 1978 ව්‍යවස්ථාවට අනුව ජනාධිපති තනතුර හිස් වී අනුප්‍රාප්තිකයකු පත් කරන තුරු ජනාධිපති තනතුරේ වැඩ බැලීම සඳහා පත් කළ යුත්තේ,

(i) අගමැතිය (ii) කථානායකය (iii) අග විනිසුරුය (iv) සභානායකය
(v) ජනාධිපති තනතුරට පත් කිරීමට සුදුසුකම් ඇති පාර්ලිමේන්තුව විසින් පත් කරන මන්ත්‍රීවරයෙකුය.

44. 1978 ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුව විසින් සම්මත කළ පනතක් නීතියක් බවට පත්වීම සඳහා සහතික කොට අනුමත කළ යුත්තේ,

(i) ජනාධිපතිය (ii) අගමැතිය. (iii) කථානායකය
(iv) සභානායකය (v) නීතිපතිය

45. ශ්‍රී ලංකාවේ වර්තමාන පළාත් පාලන ක්‍රමය සමන්විත වන ආයතනය වන්නේ,
(i) පළාත් සභා, මහනගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා වලිනි.
(ii) මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වලිනි.
(iii) මහනගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා සහ ගම්සභා වලිනි.
(iv) පළාත් සභා, මහනගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා සහ දිස්ත්‍රික් සංවර්ධන සභා වලිනි.
(v) පළාත් සභා, මහනගර සභා, නගර සභා, ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් සංවර්ධන සභා සහ ගම්සභා වලිනි.

46. ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය
(i) ද්විපක්ෂ ක්‍රමයකි.
(ii) ප්‍රධාන පක්ෂ දෙකක ප්‍රමුඛත්වය සහිත බහු පක්ෂ ක්‍රමයකි.
(iii) සමාන ලෙස බලවත් පක්ෂ කීපයකින් සමන්විත බහු පක්ෂ ක්‍රමයකි.
(iv) ප්‍රධාන වශයෙන් කේඩර පක්ෂවලින් සමන්විත බහුපක්ෂ ක්‍රමයකි.
(v) එක් පක්ෂයක නායකත්වය සහිත බහුපක්ෂ ක්‍රමයකි.

**47 - 50 දක්වා ඇති ප්‍රශ්නවල මාතෘකාව සඳහා ප්‍රකාශ පහක් ඉදිරිපත් කර ඇත. ඒවා අතුරින් එක් ප්‍රකාශයක් සාවද්‍ය වේ. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.**

47. අන්තර්ජාතික යුක්ති අධිකරණය
(i) නෙදර්ලන්තයේ හේග් නුවර පිහිටුවා ඇත.
(ii) එක්සත්ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන අධිකරණ ආයතනය වේ.
(iii) රාජ්‍යයන් අතර හට ගැනෙන ආරවුල් විසඳීම මෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානයට හා එහි විශේෂිත ආයතන වලට නීති උපදෙස් දීමේ බලය ද ඇත.
(iv) පුද්ගලයින් අතර මෙන්ම අන්තර්ජාතික සංවිධාන අතර ඇතිවන ගැටුම් ද විභාග කිරීමේ බලය ඇත.
(v) මහා මණ්ඩලය සහ ආරක්ෂක මණ්ඩලය විසින් නව අවුරුදු නිළ කාලයක් සඳහා පත් කරන විනිශ්චයකාරවරුන් 15 දෙනෙකුගෙන් සමන්විත වේ.

48. පොදු රාජ්‍ය මණ්ඩලය
(i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුබද්ධිත සංවිධානයක් වේ.
(ii) ස්වේච්ඡා සංවිධානයක් වන අතර සාමාජිකත්වය විවෘත වන්නේ ස්වාධිපති රාජ්‍යයන්ට පමණි.
(iii) බ්‍රිතානය රජින නායකත්වය දරනු ලැබේ.
(iv) ප්‍රධාන ලෙස අවධානය යොමු කරන්නේ සාමාජික රාජ්‍යයන් අතර අධ්‍යාපනය, සෞඛ්‍ය සහ යහපාලනය සාධාරණ නීති ක්‍රමයක් ඇති කිරීම මානව හිමිකම් යනාදි ක්ෂේත්‍රවල සහයෝගය වර්ධනය කිරීමටය.
(v) වර පත්‍රයක් හෝ ව්‍යවස්ථාවක් නොමැති ලෝකයේ ඇති එකම අන්තර්ජාතික රාජ්‍ය සංවිධානය වේ.

49. කලාපීය සහයෝගිතාව සඳහා වූ දකුණු ආසියානු සංවිධානය

(i) අන්තර්ජාතික ක්ෂේත්‍රය තුළ පොදුවේ හඳුන්වන්නේ සාක් යන නාමයෙනි.

(ii) ආරම්භක වශයෙන් දකුණු ආසියාතික රාජ්‍යයන් හතක් විසින් 1985 දෙසැම්බර් 8 දින පිහිටුවන ලදී.

(iii) ආර්ථික සාමාජීය සංස්කෘතික තාක්‍ෂණික විද්‍යාත්මක යනාදි ක්ෂේත්‍රයන්හි කලාපීය සහයෝගිතාව වර්ධනය කිරීම ඉලක්ක කරගෙන ඇත.

(iv) ඉහළම තීරණ ගැනීමේ ආයතනය වන රාජ්‍ය නායක සමුළුව වාර්ෂිකව පවත්වනු ලැබේ.

(v) තීරණ ගැනීම කරනු ලබන්නේ බහුතර ඡන්දයෙනි.

50. නොබැඳි ව්‍යාපාරය

(i) 1961 දී පවත්වන ලද නොබැඳි රටවල නායකයින්ගේ බෙල්ග්‍රේඩ් සමුළුවේ දී පිහිටුවන ලදී.

(ii) නිල වශයෙන් කිසිදු බල කඳවුරකට නොබැඳුණු රාජ්‍ය කණ්ඩායමක් ලෙස සලකනු ලැබේ.

(iii) එකිනෙකාගේ දේශ සීමා ඒකාග්‍රතාවයට ගරු කිරීම, ආක්‍රමනික නොවීම, දේශීය කටයුතු වලට මැදහත් නොවීම, සමානාත්මකතාව සහ සාමකාමී සහජීවනය යන මූලධර්ම මත ක්‍රියාත්මක වේ.

(iv) ආයතනික යාන්ත්‍රණයක් මත ක්‍රියාත්මක වන අතර එහි ඉහළම ආයතනය නොබැඳි රටවල රාජ්‍ය නායක සමුළුව වේ.

(v) සීතල යුද්ධය අවසන් වීමෙන් පසු අභාවයට ගියේය.

2016 . 06 . 05

පළමුවා රය - 2016

# ද මැසිනොද් විද්‍යාලය
## දේශපාලන විද්‍යාව
### 13 වසර
### A කොටස කාලය පැය 3 යි

Learning Resource Center
R
De Mazenod College
Kandana

1) " දේශපාලන විද්‍යාව විද්‍යාත්මකව අධ්‍යයනය කළ නොහැකි බව පොදුවේ පිළිගත් මතයක් වන්නේය" මෙම මතය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති තර්ක දෙකක් දක්වන්න.

....................................................................................................

....................................................................................................

2) චර්යාවාදයේ මූලිකාංග දෙකක් දක්වන්න.

....................................................................................................

....................................................................................................

3) රාජ්‍ය සමාජයෙන් වෙනස් වන සාධක දෙකක් සඳහන් කරන්න.

....................................................................................................

....................................................................................................

4) ස්වාධිපති න්‍යායයේ සහ බලතල බෙදීමේ න්‍යායයේ නිර්මාතෘවරුන් දෙදෙනා කවුරුන්ද ?

....................................................................................................

....................................................................................................

5) "කුමාරයා" කෘතියේ සහ "සිවිල් ආණ්ඩුව පිළිබඳ සම්මුතින් දෙකක් " කෘතියේ කතෘවරුන් දෙදෙනා නම් කරන්න.

....................................................................................................

....................................................................................................

6) බලතල බෙදීම

පාර්ලිමේන්තු ස්වාධිපතීත්වය

දේශපාලන සංකේත

අධිකරණ විවරණ බලය

ඉහත දක්වා ඇති විධික්‍රම අතුරින් ආණ්ඩුවේ බලය සංවරණය කිරීම සඳහා යොදා ගත හැකි විධික්‍රම දෙක නම් කරන්න.

....................................................................................................

....................................................................................................

7) කැබිනට් ආණ්ඩුක්‍රමය විධායකය කොටස් දෙකකින් සමන්විත වේ. එම කොටස් දෙක නම් කරන්න.

..........................................................................................................................

..........................................................................................................................

8) කොංග්‍රස් මණ්ඩලය නමින් හැඳින්වෙන ඇමරිකානු එක්සත් ජනපදයේ ව්‍යවස්ථාදායකය සමන්විත වන්නේ මණ්ඩල දෙකකිනි. එම මණ්ඩල දෙක නම් කරන්න.

..........................................................................................................................

..........................................................................................................................

9) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලය සමන්විත වන්නේ සාමාජිකයින් වර්ග දෙකකිනි. එම වර්ග දෙක නම්කොට ඒ ඒ වර්ගයට අයත් සාමාජික සංඛ්‍යාව සඳහන් කරන්න.

..........................................................................................................................

..........................................................................................................................

10) රාජ්‍ය ප්‍රතිපත්ති චක්‍රය අවධි සයකින් සමන්විත වේ. එයින් අවධි දෙකක් නම් කරන්න.

..........................................................................................................................

..........................................................................................................................

11) කෝල්බෲක් කොමිසමේ නිර්දේශ පරිදි 1833 දී ස්ථාපිත කළ ව්‍යවස්ථාදායක සභාව සමන්විත වූයේ දෙවර්ගයක නියෝජිතයන්ගෙනි. එම දෙවර්ගය නම්කොට ඒ ඒ වර්ගයට අයත් වූ නියෝජිත සංඛ්‍යාව දක්වන්න.

..........................................................................................................................

..........................................................................................................................

12) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ අමාත්‍ය මන්ඩලය සමන්විත වූයේ දෙවර්ගයක අමාත්‍යවරුන්ගෙනි. එම දෙවර්ගය නම්කොට ඒ ඒ වර්ගයට අයත් වූ අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව දක්වන්න.

..........................................................................................................................

..........................................................................................................................

13) සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිට වූ සෙනට් සභාවට නියෝජිතයන් පත් කළේ ක්‍රම දෙකක් අනුවය. එම ක්‍රම දෙක නම් කොට එක් එක් ක්‍රමය යටතේ පත් කළ නියෝජිත සංඛ්‍යාව දක්වන්න.

..........................................................................................................................

..........................................................................................................................

14) සුළුතර කණ්ඩායම් වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සැපයූ ආවරණ දෙකක් නම් කරන්න.

..........................................................................................................................

..........................................................................................................................

දේශපාලන විද්‍යාව 13 ශ්‍රේණිය A 2016.06.05

15) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිට වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය ඉදිරියට ගෙන ආ හැකි පනත් කෙටුම්පත් වර්ග දෙකක් වූ අතර ඒ ඒ පනත් කෙටුම්පත් වර්ගය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය ක්‍රියාත්මක විය යුතු කාල වකවානු දෙකක් ද විය. එම පාර්ලිමේන්තු පනත් කෙටුම්පත් වර්ග දෙක සහ ඒ ඒ වර්ගයට වෙන් කරන ලද කාලවකවානු දක්වන්න.

....................................................................................................

....................................................................................................

16) 1978 ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය භාෂා ලෙස පිළිගෙන ඇති භාෂා දෙක නම් කරන්න.

....................................................................................................

....................................................................................................

17) 1978 ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කර තිබෙන ඉහළ අධිකරණ දෙක සහ එම අධිකරණ දෙකේ සංයුතිය සඳහන් කරන්න.

....................................................................................................

....................................................................................................

18) ජනාධිපති මැතිවරණ පෙත්සම්

පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම්

ඉහත දක්වා ඇති පෙත්සම් විභාග කිරීමේ අධිකරණ බලය සහිතව 1978 ව්‍යවස්ථාව යටතේ පිහිටුවා ඇති අධිකරණ දෙක පිළිවෙලින් නම් කරන්න.

....................................................................................................

....................................................................................................

19) "ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය ප්‍රධාන පක්ෂ දෙකක නායකත්වය යටතේ ක්‍රියාත්මක වන බහු පක්ෂ ක්‍රමයක් ලෙස හැඳින්වේ" එම ප්‍රධාන පක්ෂ දෙක නම් කරන්න.

....................................................................................................

....................................................................................................

20) පාර්ලිමේන්තුව නමින් හැඳින්වෙන 1978 ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාදායකය සමන්විත වන්නේ ක්‍රම දෙකක් අනුව තෝරාපත් කරන මන්ත්‍රීවරුන්ගෙනි. එම ක්‍රම දෙක සහ ඒ ඒ ක්‍රමය යටතේ තෝරා පත් කරන මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව සඳහන් කරන්න.

....................................................................................................

....................................................................................................

B සහ C කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගත යුතු වේ.

## B කොටස

(1) දේශපාලන විද්‍යාව ගතික විෂයයක් වන අතර එහි විෂය ක්ෂේත්‍රය දෛනිකව වර්ධනය වේ. ඔබ එකග වන්නේ ද ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(2) යහපත් සහ අයහපත් ලක්ෂණ වලට අවධානය යොමුකරමින් පහත දැක්වෙන මාතෘකා අතරින් ඕනෑම දෙකක් විභාග කරන්න.

(i) නම්‍ය හා අනම්‍ය ආණ්ඩුක්‍රමය ව්‍යවස්ථා

(ii) බලතල බෙදීම

(iii) සමානුපාතික නියෝජන ක්‍රමය

(iv) අධිකරණ විවරණ බලය

(v) ජනාධිපති සහ කැබිනට් ආණ්ඩුක්‍රම

(3) පහත දැක්වෙන ඒවායින් දෙකක් සාකච්චා කරන්න.

(i) ජාතික දේශපාලනය සහ අන්තර්ජාතික දේශපාලනය අතර වෙනස්කම්

(ii) රාජ්‍ය ප්‍රතිපත්ති වල ස්වභාවය හා වැදගත්කම

(iii) ගැටුම් කළමනාකරණය කිරීමේ විධික්‍රම

(4) පහත දැක්වෙන මාතෘකා දෙකක් සාකච්ඡා කරන්න.

(i) බ්‍රිතාන්‍ය රජිනගේ බලතල කාර්යයන් හා තත්ත්වය

(ii) ඉන්දියානු සන්ධීය ආණ්ඩුක්‍රමය තුළ විධායකය ව්‍යවස්ථාදායකය අතර පවත්නා සම්බන්ධතා

(iii) ඇමරිකානු ආණුඩුක්‍රමය තුළ සෙනට් සභාවේ කාර්යභාරය

## C කොටස

(5) ලංකාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයේ දේශපාලන ආර්ථික හා සමාජ ප්‍රතිඵල මොනවාද ?

(6) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ආශ්‍රිතව පහත දැක්වෙන ඒවා විභාග කරන්න.

(i) අමාත්‍ය මණ්ඩලය හා එහි කාර්යයන්

(ii) විධායක කාරක සභා ක්‍රමය

(7) 1948 සෝල්බරි ව්‍යවස්ථාව හා 1972 පළමු ජනරජ වයවස්ථාව යටතේ ස්ථාපිත කළ පහත දැක්වෙන දේශපාලන ආයතන දෙක සංසන්දනය කොට වෙනස්කම් දක්වන්න.

(i) නාමික විධායකය

(ii) ව්‍යවස්ථාදායකය

2016 . 06 . 05 දේශපාලන විද්‍යාව A කොටස .
13 ශ්‍රේණිය .

(8) පහත දැක්වෙන ඕනෑම මාතෘකා දෙකක් ගැන අදහස් දක්වන්න.

(i) ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ

(ii) ශ්‍රී ලංකාවේ පළාත් ආණ්ඩුකාරවරයාගේ බලතල හා කාර්යයන්

(iii) 1978 ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ ශ්‍රේෂ්ඨාධිකරණයේ බලතල හා කාර්යයන්

(9) 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව යටතේ පහත දැක්වෙන ඕනෑම දෙකක් විභාග කරන්න.

(i) ජනාධිපති සහ කැබිනට් මණ්ඩලය

(ii) ජනාධිපති සහ අධිකරණය

(iii) ජනාධිපති සහ රාජ්‍ය සේවය

(iv) ජනාධිපති හා පළාත් සභා